# ජාතික පොලිස් කොමිෂන් සභාව

## වාර්ෂික වාර්තාව

# 2013

# 1. <u>පූර්විකාව</u>

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වන සංශෝධනය යටතේ පිහිටුවනු ලැබූ ප්‍රථම ජාතික පොලිස් කොමිෂන් සභාව වසර 03 ක කාලයක් සඳහා 2012 පෙබරවාරි මස 22 වන දින ස්ථාපිත කරන ලදී. මෙම කොමිෂන් සභාවේ සභාපති ලෙස ජනාධිපති නීතිඥ එස්.සී.බී. වල්ගම්පාය මහතා පත්විය. එසේ පිහිටුවනු ලැබූ ජාතික පොලිස් කොමිෂන් සභාවේ 2013 සඳහා වූ වාර්ෂික වාර්තාව අභිමානයෙන් යුතුව මෙසේ ඉදිරිපත් කර සිටියි.

- **දැක්ම** : "යුක්තියට සහ සාධාරණත්වයට රැකවලෙක්"
- **මෙහෙවර** : "මානව හිමිකම් සුරැකීමට දිරි දෙමින් නීතියේ ආධිපත්‍යයට ගරු කරමින් මහජනතාවට වගවීමේ අරමුණින් පොලීසියට එරෙහිව ඇති මහජන පැමිණිලි විමර්ශනය කිරීම"
- **අරමුණ** : "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සුරක්ෂිත කර ඇති මහජනතාවගේ මූලික අයිතිවාසිකම් සහතික කරනු වස් පොලිස් නිලධරයකුට / නිලධාරීන්ට හෝ පොලිස් බලකායට එරෙහිව ඇති මහජන පැමිණිලි විමර්ශනය කිරීම"

# 2. <u>ජාතික පොලිස් කොමිෂන් සභාව</u>

## 2.1 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වන සංශෝධනයේ 155 ඊඊ වගන්තිය අනුව කොමිෂන් සභාවේ බලතල හා කාර්යයන්

"පොලිස් නිලධාරියෙකුට, නිලධාරීන්ට හෝ පොලිස් බලකායට එරෙහිව මහජනයාගෙන් හෝ ඕනෑම අතෘප්තියට පත් පුද්ගලයෙකුගෙන් ලැබෙන පැමිණිලි බාර ගැනීම, විමර්ශනය කිරීම සහ පාර්ලිමේන්තුව විසින් බලාත්මක කර ඇති යම් නීතියක් අනුව සහන සලසා දීම සඳහා පොලිස් කොමිෂන් සභාවට බලය ඇත්තේය."

2012 පෙබරවාරි මස 22 වන දින ජාතික පොලිස් කොමිෂන් සභාව පිහිටුවීමත් සමගම කොමිෂන් සභාවේ බලතල පිළිබඳ සීමා තීරණය කිරීමත්, කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම අරභයා උපායමාර්ගික සැළැස්මක් පිළියෙළ කිරීමත් අත්‍යවශ්‍ය කාර්යයක් විය. 2012 වසරේදී එම කාර්යයන් සියල්ල නිම කරනු

ලැබූ අතර 2013 වසරේදී මහජන පැමිණිලි විමර්ශන ක්ෂේත්‍රය වෙත සම්පූර්ණයෙන්ම අවධානය යොමු කිරීමට අවකාශ ලැබිණ.

### 2.2 කොමිෂන් සභාවේ සාමාජිකත්වය

| | | |
|---|---|---|
| • ජනාධිපති නීතිඥ එස්.සී.බී. වල්ගම්පාය මහතා | - | සභාපති |
| • පූජ්‍ය ඇල්ලේ ගුණවංශ හිමි | - | සාමාජික |
| • ඩී. දිසානායක මහතා | - | සාමාජික |
| • නීතිඥ ෂාමේන් මදුරසිංහ මිය | - | සාමාජික |
| • ආර්. සිවරාමන් මහතා | - | සාමාජික |
| • එම්.එම්.එම්. මව්ජූඩ් මහතා | - | සාමාජික |
| • නිව්ටන් ගුණරත්න මහතා | - | සාමාජික |

ජාතික පොලිස් කොමිෂන් සභාව සෑම සතියකම බදාදා දින ප.ව. 3.00 ට රැස්වන අතර 2013 වර්ෂය තුළ රැස්වීම් 47 ක් පවත්වන ලද අතර සමාලෝචිත වර්ෂය තුළ මහජන පැමිණිලි විමර්ශන වලට සහ වෙනත් කාරණා වලට අදාල කොමිෂන් සභා පත්‍රිකා 29 ක් සහ විවිධ අංශ විසින් සතිපතා ඉදිරිපත් කරනු ලැබූ පනත් කෙටුම්පත්, ප්‍රගති වාර්තා, ලිපි, සහ මාධ්‍ය වාර්තා සම්බන්ධයෙන් කටයුතු කර තීරණ ලබා දී ඇත.

## 3. <u>ජාතික පොලිස් කොමිෂන් සභා කාර්යාලය</u>

ජාතික කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇත්තේ ජාතික පොලිස් කොමිෂන් සභා කාර්යාලය වෙතය. 2013 වර්ෂයේදී ජාතික පොලිස් කොමිෂන් සභා කාර්යාලය BMICH පරිශ්‍රය තුළ ගොඩනැගිලි අංක 09 වෙත ගෙන එන ලදී.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියකු වන නීතිඥ ටී.එම්.කේ.බී. තෙන්නකෝන් මහතා වත්මන් ජාතික පොලිස් කොමිෂන් සභාවේ ලේකම්වරයා ලෙස කටයුතු කරයි.

ජාතික පොලිස් කොමිෂන් සභා කාර්යාලය පහත සඳහන් අංශ වලින් සමන්විත වේ.

1. පාලන අංශය
2. මහජන පැමිණිලි විමර්ශන අංශය
3. මුදල් අංශය

4. මාධ්‍ය ඒකකය

5. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය

2013 වර්ෂයට අදාලව ඉහත එක් එක් අංශය මගින් සිදුකරනු ලැබූ කාර්යයන් සහ එහි ප්‍රගතිය මෙම වාර්තාවෙන් සමාලෝචනයට භාජනය කෙරේ.

### 3.1 පාලන අංශය

ජාතික පොලිස් කොමිෂන් සභාවෙහි අනුමත සේවක සංඛ්‍යාවට අදාළ තොරතුරු ඇමුණුම 1 න් දක්වා ඇත.

### 3.2 මහජන පැමිණිලි විමර්ශන අංශය

#### 3.2.1 මහජන පැමිණිලි විමර්ශන අංශයේ කාර්ය භාරය

පොලිස් නිලධාරීන්ට හෝ පොලිස් බලකායට එරෙහිව මහජනයාගෙන් ලැබෙන පැමිණිලි බාරගැනීම, ඒවා විමර්ශනය කිරීම සහ අතෘප්තියට පත් මහජනයා වෙත සහන සලසා දීම මහජන පැමිණිලි විමර්ශන අංශයේ ප්‍රධාන වගකීම වන අතර ඒ සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වන සංශෝධනයේ 155 ඊඊ වගන්තිය මගින් කොමිෂන් සභාව වෙත බලතල ලබා දී ඇත. 2012 ජුනි මාසයේදී මහජන පැමිණිලි විමර්ශන කාර්යය ආරම්භ කරනු ලැබූ අතර ඒ සඳහා නව කාර්ය පටිපාටි රීති සකස්කර 2012 අගෝස්තු වන විට රජයේ ගැසට් පත්‍රයේ පලකරනු ලැබීය.

කොමිෂන් සභාවේ නිරන්තර අධීක්ෂණය හා මගපෙන්වීම යටතේ මහජන පැමිණිලි විමර්ශන අධ්‍යක්ෂ සහ සියළු පළාත් ආවරණය වන පරිදි දිවයින පුරා පිහිටුවා ඇති පළාත් කාර්යාල වල කාර්ය මණ්ඩලය හා එක්ව මහජන පැමිණිලි විමර්ශන කාර්ය සාර්ථකව ඉටුකර ඇත. පවත්නා අවම සම්පත් උපරිම ලෙස යොදාගනිමින් පොලිස් කොමිෂන් සභාව පිලිබඳ විශ්වාසය තබා පැමිණි මහජනයා වෙත අපක්ෂපාතී වූත් උපරිම සාධාරණ වූත් විසඳුම් ලබා දීමට කටයුතු කර ඇත.

පොලීසියට එරෙහිව ඇති මහජන පැමිණිලි භාරගැනීම සහ විමර්ශන කටයුතු කිරීම සඳහා අධ්‍යක්ෂවරයෙකුගේ ප්‍රධානත්වයෙන් මහජන පැමිණිලි විමර්ශන අංශය පිහිටුවා ඇත. සෑම පළාතක් සඳහාම එක් අධ්‍යක්ෂවරයෙකු බැගින් පළාත් 09 ට අධ්‍යක්ෂවරු 9 දෙනෙක්ගේ ප්‍රධානත්වයෙන් පළාත් කාර්යාල 9 ක් පිහිටුවා ඇති අතර මීට අතිරේක වශයෙන් බස්නාහිර පළාතේ ජනගහණය සැළකිල්ලට

ගෙන ගම්පහ සහ කළුතර යන දිස්ත්‍රික් දෙක සඳහා දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගේ ප්‍රධානත්වයෙන් දිස්ත්‍රික් කාර්යාල දෙකක්ද ස්ථාපිත කර ඇත.

මීට අමතරව සතියේ ඕනෑම දිනයකදී ජාතික පොලිස් කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයේදී සභාපතිතුමා, ලේකම්තුමා හෝ මහජන පැමිණිලි අධ්‍යක්ෂ හමු වී ස්වකීය පැමිණිලි හෝ දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමට අවස්ථාව සලස්වා දෙනු ලැබූ අතර මහජන පැමිණිලි සම්බන්ධයෙන් සහන සැලසීමෙහිලා විවෘත හා විනිවිදභාවයෙන් යුතු ප්‍රතිපත්තියක් අනුගමනය කරනු ලැබීය.

### 3.2.2 මහජන පැමිණිලි අංශයේ සංයුතිය

විශ්‍රාමලත් ජ්‍යෙෂ්ඨ පරිපාලන සේවයේ නිලධාරියකු වන එන්. ආරියදාස කුරේ මහතා මහජන පැමිණිලි විමර්ශන අංශයේ අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරන අතර ඒ මහතාගේ අධීක්ෂණය යටතේ සියළු පළාත් සහ දිස්ත්‍රික් කාර්යාල ක්‍රියාත්මක වේ.

**වගුව 1**

**<u>පළාත් / දිස්ත්‍රික් කාර්යාල ලිපිනයන්, පළාත් / දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන්ගේ නම්, දුරකතන අංක</u>**

| අංකය | පළාත් අධ්‍යක්ෂවරයාගේ නම සහ වර්තමාන කාර්යාල ලිපිනය | දුරකතන අංකය | සේවය | විශ්‍රාම ගනු ලබන විට දැරූ තනතුර |
|---|---|---|---|---|
| 1. | එන්. ආරියදාස කුරේ මහතා<br>අධ්‍යක්ෂ (මහජන පැමිණිලි)<br>ජාතික පොලිස් කොමිෂන් සභාව,<br>BMICH පරිශ්‍රය, බෞද්ධාලෝක මාවත,<br>කොළඹ 07. | 011 – 5107725 | ශ්‍රී ලං.ප.සේ. (විශේෂ ශ්‍රේණිය) | අතිරේක ලේකම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 2. | ආනන්ද විජේසූරිය මහතා<br>අධ්‍යක්ෂ (කොළඹ)<br>ජාතික පොලිස් කොමිෂන් සභාව,<br>BMICH පරිශ්‍රය, බෞද්ධාලෝක මාවත,<br>කොළඹ 07. | 011-5107722 | ශ්‍රී ලං.පො.දෙ. | නියෝජ්‍ය පොලිස්පති |
| 3. | යූ.කේ. ගුණවර්ධන මහතා<br>අධ්‍යක්ෂ (ගම්පහ)<br>ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය,<br>ජාතික පොලිස් කොමිෂන් සභාව,<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ. | 033 – 5107722 | ශ්‍රී ලං.ප.සේ. I | අතිරේක දිස්ත්‍රික් ලේකම් - ගම්පහ |

| | | | | |
|---|---|---|---|---|
| 4. | ආර්.එම්.එම්.බී. රත්නායක මහතා<br>අධ්‍යක්ෂ (කළුතර)<br>කළුතර දිස්ත්‍රික් කාර්යාලය,<br>ජාතික පොලිස් කොමිෂන් සභාව,<br>5 වන මහළ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර. | 034 – 5107722 | ශ්‍රී ලං.ප.සේ. I | දිස්ත්‍රික් ලේකම් - නුවරඑළිය |
| 5. | ධනපාල තන්තිරිගේ මහතා<br>පළාත් අධ්‍යක්ෂ (ඌව)<br>ඌව පළාත් කාර්යාලය,<br>ජාතික පොලිස් කොමිෂන් සභාව,<br>නියෝජ්‍ය ප්‍රධාන කාර්යාලය,<br>ඉංජිනේරු සේවා, පිංඅරාව, බදුල්ල. | 055 – 5107722 | ශ්‍රී ලං.ප.සේ. I | දිස්ත්‍රික් ලේකම් - බදුල්ල |
| 6. | ඊ.එල්. චන්ද්‍රසේන මහතා<br>පළාත් අධ්‍යක්ෂ (සබරගමුව)<br>සබරගමුව පළාත් කාර්යාලය,<br>ජාතික පොලිස් කොමිෂන් සභාව,<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,<br>නවනගරය, රත්නපුර. | 045 – 5107722 | ශ්‍රී ලං.ප.සේ. I | ලේකම්, ඉඩම් හා කෘෂිකර්ම අමාත්‍යාංශය, සබරගමුව පළාත් සභාව. |
| 7. | එච්.එම්.පී. කුමාරසිරි මහතා<br>පළාත් අධ්‍යක්ෂ (මධ්‍යම)<br>මධ්‍යම පළාත් කාර්යාලය,<br>ජාතික පොලිස් කොමිෂන් සභාව,<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර. | 081 – 5107722 | ශ්‍රී ලං.ග.සේ. I | ගණකාධිකාරී, මධ්‍යම පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය |
| 8. | ජී. හේවාවිතාරණ මහතා<br>පළාත් අධ්‍යක්ෂ (දකුණ)<br>දකුණු පළාත් කාර්යාලය,<br>ජාතික පොලිස් කොමිෂන් සභාව,<br>පළමුවන මහළ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල. | 091 – 5107722 | ශ්‍රී ලං.ප.සේ. I | දිස්ත්‍රික් ලේකම් - ගාල්ල |
| 9. | ඩබ්.එම්. ජයවර්ධන මහතා<br>පළාත් අධ්‍යක්ෂ (වයඹ)<br>වයඹ පළාත් කාර්යාලය,<br>ජාතික පොලිස් කොමිෂන් සභාව,<br>පේෂකර්ම වෙළඳ සංකීර්ණය, තුන්වන මහළ, අංක 08 කාමරය, අංක 04, මිහිඳු මාවත, කුරුණෑගල. | 037 – 5107722 | ශ්‍රී ලං.ප.සේ. I | ප්‍රාදේශීය ලේකම් - කුරුණෑගල |
| 10. | ආර්.අයි.බී.ආර්.බී. රත්නමලල මහතා<br>පළාත් අධ්‍යක්ෂ (උතුරු මැද)<br>උතුරු මැද පළාත් කාර්යාලය,<br>ජාතික පොලිස් කොමිෂන් සභාව,<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුර. | 025 – 5107722 | ශ්‍රී ලං.ප.සේ. I | ප්‍රාදේශීය ලේකම් - ගල්ගමුව |
| 11. | ආචාර්ය කේ. ත්‍යාගරාජා මහතා<br>පළාත් අධ්‍යක්ෂ (උතුර)<br>උතුරු පළාත් කාර්යාලය,<br>ජාතික පොලිස් කොමිෂන් සභාව,<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, යාපනය. | 021 – 5107722 | ශ්‍රී ලං.ග.සේ. I | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (විගණන) - නැගෙනහිර පළාත් සභාව. |

| | | | | |
|---|---|---|---|---|
| 12. | එස්. සාමිතම්බි මහතා<br>පළාත් අධ්‍යක්ෂ (නැගෙනහිර)<br>නැගෙනහිර පළාත් කාර්යාලය,<br>ජාතික පොලිස් කොමිෂන් සභාව,<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මන්මුනේ උතුර,<br>මඩකලපුව. | 065 – 5107722 | ශ්‍රී.ලං.ප.සේ. I | සහකාර කොමසාරිස්, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, මඩකලපුව. |

### 3.2.3 2013 වසරේදී ගන්නා ලද නව ක්‍රියාමාර්ග

2013 වසරේ දෙසැම්බර් මස 13 වන දින ජාතික පොලිස් කොමිෂන් සභාව මහජනයාට පැමිණිලි කිරීමට පහසුවනු පිණිස පැය 24 පුරා ක්‍රියාත්මක වන ක්ෂණික දුරකතන **අංක 0710 – 361010** හඳුන්වාදෙනු ලැබූ අතර එම අංකය සඳහා 2013.12.31 වන විට පැමිණිලි 60 ක් ලැබී තිබුණි.


ප්‍රධාන කාර්යාලයට සහ පළාත් දිස්ත්‍රික් කාර්යාල වෙත 2013.12.31 වන විට ලැබී තිබූ විවිධ මහජන පැමිණිලි 470 ක් (ක්ෂණික දුරකතන අංකයට ලැබුණු පැමිණිලි 60 ඇතුලත්ව) අතුරින් පැමිණිලි 307 ක් විමර්ශන කටයුතු අවසන් කර තිබුණි.

**2013 දෙසැම්බර් 31 වන දිනට ජාතික පොලිස් කොමිෂන් සභාවේ එක් එක් පළාත් / දිස්ත්‍රික් කාර්යාල වෙත ලැබුණු පැමිණිලි සහ විමර්ශන අවසන් කරනු ලැබූ පැමිණිලි පිළිබඳ සාරාංශය**

වගුව - 2

| | **කාර්යාලය** | **2013 වර්ෂයේ සාරාංශය** | |
|---|---|---|---|
| | | **2013 වසර තුළ ලැබුණු පැමිණිලි** | **විමර්ශන අවසන් කරනු ලැබූ පැමිණිලි සංඛ්‍යාව** |
| 1. | කොළඹ | 58 | 39 |
| 2. | ගම්පහ | 52 | 37 |
| 3. | කළුතර | 33 | 20 |
| 4. | මහනුවර | 54 | 39 |
| 5. | කුරුණෑගල | 34 | 28 |
| 6. | ගාල්ල | 79 | 65 |
| 7. | අනුරාධපුරය | 32 | 28 |
| 8. | බදුල්ල | 26 | 16 |
| 9. | රත්නපුර | 28 | 24 |
| 10. | යාපනය | 08 | 05 |
| 11. | මඩකලපුව | 10 | 06 |
| | **එකතුව** | **414** | **307** |

ප්‍රස්ථාරය - I




2013 වසරේ කොමිෂන් සභාවට ලැබුණු පැමිණිලි සහ විමර්ශනය කර අවසන් කරනු ලැබූ පැමිණිලි 2 වන වගුව හා ප්‍රස්ථාරය 1 මගින් සංසන්දනාත්මකව විග්‍රහයක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව ජාතික පොලිස් කොමිෂන් සභාවට 2013 වසර තුළ ලැබුණු පරමිණිලි 414 න් 307 ක් විමර්ශනය කර පැමිණිලි පාර්ශව වෙත සහන ලබා දීමට ක්‍රියා කර ඇත. විමර්ශනය කර අවසන් කර ඇති පැමිණිලි පිළිබඳ විශලේෂණය කරන විට උසාවියේ නඩු කටයුතු පවත්වාගෙන යනු ලැබූ ඇතැම් පැමිණිලි පිළිබඳව ගැඹුරින් විමර්ශනය කිරීමේ සීමාකම් පැවතුනි. එසේම ප්‍රමාණවත් සාක්ෂි නොමැති වීම නිසා සනාථ කර ගැනීමට නොහැකි වූ පැමිණිලිද, පැමිණිලිකරු විසින් පසුව ඉල්ලා අස්කර ගත් පැමිණිලිද මෙම විමර්ශනය කර අවසන් කර ඇති පැමිණිලි සංඛ්‍යාවට ඇතුලත් වේ.

**<u>පැමිණිල්ලේ ස්වභාවය අනුව 2013 වසරේ පොලීසියට එරෙහිව ලැබුණු පැමිණිලි</u>**


වගුව - 3

| | පැමිණිල්ලේ ස්වභාවය අනුව | ලැබුණු පැමිණිලි සංඛ්‍යාව |
|---|---|---|
| 1. | පොලීසිය මගින් ක්‍රියා නොකර සිටීම | 134 |
| 2. | බලය අනිසි ලෙස යෙදවීම | 103 |

| | | |
|---|---|---|
| 3. | පක්ෂග්‍රාහීත්වය | 83 |
| 4. | නීති විරෝධීව අත් අඩංගුවට ගෙන රඳවා තබා ගැනීම | 21 |
| 5. | ව්‍යාජ චෝදනා ඉදිරිපත් කර රිමාන්ඩ් කිරීම | 17 |
| 6. | පහරදීම | 13 |
| 7. | වධහිංසා පැමිණවීම | 05 |
| 8. | අල්ලස් හා දූෂණ චෝදනා | 03 |
| 9. | කාන්තාවන්ට සහ ළමුන්ට හිරිහැර කිරීම හෝ ළමා අපචාර ක්‍රියා | 04 |
| 10. | පොලිස් භාරයේදී මරණයට පත්වීම් | -- |
| 11. | වෙනත් | 31 |
| | **එකතුව** | **414** |

බොහෝ වින්දිතයින් හට සැලකිය යුතු සහන ලබා දීමට සමාලෝචිත වර්ෂය තුළ කොමිෂන් සභාවට හැකියාව ලැබී ඇත. විශේෂයෙන්ම පොලිස් නිලධාරීන් හෝ පොලිස් බලකාය විසින් මහජනයාගේ නිර්ව්‍යාජ වූ පැමිණිලි සම්බන්ධයෙන් නිසි පරිදි ක්‍රියා නොකරන ලද පැමිණිලි 134 ක් ද පක්ෂග්‍රාහීවීම සම්බන්ධයෙන් පැමිණිලි 83 ක්ද, බලය අයුතු ලෙස පාවිච්චි කිරීම හා සම්බන්ධ වූ පැමිණිලි 103 ක්ද, නීති විරෝධී ලෙස අත්අඩංගුවට ගෙන රඳවා තබා ගැනීම් සම්බන්ධ පැමිණිලි 21 ක්ද, අත්අඩංගුවට ගෙන වධ හිංසා පැමිණවීම පිළිබඳ පැමිණිලි 05 ක්ද, පොලිස් පහරදීම් සම්බන්ධ පැමිණිලි 13 ක්ද, බොරු පැමිණිලි ඉදිරිපත් කර රිමාන්ඩ්භාරයට පත් කිරීම් 17 ක්ද වශයෙන් පැමිණිලි පිළිබඳ විමර්ශන පවත්වා සහනයක් බලාපොරොත්තුවෙන් පොලිස් කොමිෂන් සභාව කෙරේ විශ්වාසය තැබූ මහජනයා වෙත හැකි උපරිම අයුරින් සහන ලබා දී ඇත. මේ පිළිබඳ සවිස්තරාත්මක විග්‍රහයක් පහත සඳහන් ප්‍රස්ථාර සටහන සහ සංඛ්‍යා වගුව ඇසුරින් මනාව නිරූපනය වේ.

**ප්‍රස්ථාරය - II**



එක් එක් පළාත් අනුව සහ එක් එක් දිස්ත්‍රික් අනුව ලැබී ඇති පැමිණිලි පිළිබඳ වගු අංක 2 න් සහ ඊට අදාල ප්‍රස්ථාරික සටහන් (ප්‍රස්ථාරය I) මගින් දක්වා ඇත. සාමාලෝචිත වර්ෂය තුළ ලැබුණු පැමිණිලි, එහි ස්වභාවය අනුව විශ්ලේෂණය කිරීමේදී මහජනයා විවිධ ආකාරයේ අසාධාරණයන්ට හා තාඩන පීඩන වලට ලක්වී ඇත. මෙම පැමිණිලි විමර්ශනය කිරීමේදී 2012 වසරේදී ගැසට් කර ඇති මහජන පැමිණිලි කාර්ය පටිපාටි රීති වල සඳහන් වන ආකාරයට වර්ගීකරණයට ලක්කර ඒ එක් එක් වර්ග අනුව විමර්ශනය කර ඇත.

ජනතාවගේ මානව අයිතිවාසිකම් සුරැකීමට, කොමිෂන් සභාව උපරිම අයුරින් ක්‍රියාමාර්ග ගෙන ඇති අතර වැඩිවෙමින් පවතින අපරාධ සහ සමාජ අසහනකාරී තත්ත්වයන් තුළ ඉදිරි වසර වල පොලිස් කොමිෂන් සභාවේ පිහිට පතා එන ජනතාවගේ වැඩිවීමක් අපේක්ෂා කළ හැකිය. සමාලෝචිත 2013 වසරට වඩා උසස් ගුණාත්මක තත්ත්වයේ සේවාවක් ලබා දීමට අවශ්‍ය කරන ධාරිතා සංවර්ධනය, තාක්ෂණික සහාය සහ පහසුකම් වැඩි දියුණු කිරිමටත් 2013 - 2015 සංයුක්ත සැලැස්මේ අඩංගු ඉදිරි සැලසුම් ද සැලකිල්ලට ගනිමින් ඉටු කිරීමට කොමිෂන් සභාව බලාපොරොත්තු වේ.

### 3.2.4 ජාතික පොලිස් කොමිෂන් සභාව මගින් මහජන පැමිණිලි විභාග කිරීම සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීමට 2013 වර්ෂය තුලදී ගන්නා ලද ක්‍රියා මාර්ග

- සියළුම ග්‍රාමනිලධාරී කාර්යාල වල ජාතික පොලිස් කොමිෂන් සභාව මගින් මහජන පැමිණිළි විභාග කිරීම සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීමට නිවේදනයක් ප්‍රදර්ශනය කිරීම.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාශ දින රැස්වීම්වලට අදාල පළාත් කාර්යාල අධ්‍යක්ෂ සහභාගී වී ජාතික පොලිස් කොමිෂන් සභාවේ කාර්යභාරය පිළිබඳව ග්‍රාමනිළධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ආරම්භ කිරීම.
- ජාතික පොලිස් කොමිෂන් සභාවේ වෙබ් අඩවිය මගින් පැමිණිලි ඉදිරිපත් කිරීමට මහජනතාවට පහසුකම් සැලසීම.
- මහජනතාවට අවශ්‍ය ඕනෑම අවස්ථාවක ජාතික පොලිස් කොමිෂන් සභාවට පැමිණිලි ඉදිරිපත් කිරීමට දවසේ පැය 24 තුලම ක්‍රියාත්මක වන හදිසි ඇමතුම් දුරකථන අංකයක් (0710361010) හඳුන්වා දීම.
- නිරන්තරයෙන් ජන මාධ්‍ය ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කරමින් ජාතික පොලිස් කොමිසම පිළිබඳ පුළුල් ප්‍රචාරයක් ලබා දීම.

### 3.2.5 2013 වර්ෂයට අදාලව ලැබුණු පැමිණිලි වලට අදාලව පොලිස් නිලධාරීන්ට එරෙහිව විනය කටයුතු කළ පැමිණිලි සංඛ්‍යාව

2013 වසර තුළ ලද පැමිණිලි අතුරින් පැමිණිලි 16 සම්බන්ධයෙන් ජාතික පොලිස් කොමිෂන් සභාවේ මැදිහත්වීම මත පොලිස් නිලධාරීන් 18 කට එරෙහිව පොලිස්පති මගින් විනය පියවර ගැනීමට කටයුතු කර ඇත. එසේ විනය පියවර ගත් අවස්ථා පිළිබඳ විස්තර දිස්ත්‍රික් / පළාත් මට්ටමින් වගුව 5 මගින් දක්වා ඇත.

වගුව - 5

| පළාත / දිස්ත්‍රික්කය | ලැබූ පැමිණිලි සංඛ්‍යාව |
|---|---|
| කොළඹ | 2 |
| ගම්පහ | 4 |
| මධ්‍යම පළාත | 2 |
| වයඹ පළාත | 5 |
| උතුරුමැද පළාත | 1 |
| ඌව පළාත | 2 |
| **එකතුව** | **16** |

### 3.2.6 ජාතික පොලිස් කොමිෂන් සභා ආනුෂංගික විධිවිධාන පනත

2012 වර්ෂයේ ජනාධිපතිවරයා විසින් පත්කරනු ලැබූ කමිටුව මගින් කරනු ලැබූ නිර්දේශ පදනම්කරගෙන ජාතික පොලිස් කොමිෂන් සභා ආනුෂංගික විධිවිධාන පනත සකස් කරනු ලැබීය.

ජනාධිපති කාර්යාලය වෙත යොමු කරනු ලැබූ පනත මෙම 2013 වසරේදී නීතිපතිවරයාගේ නිර්දේශද සැලකිල්ලට ගනිමින් නීති කෙටුම්පත් සම්පාදකගේද සහාය ඇතිව අවශ්‍ය සංශෝධන සිදුකර අමාත්‍යමණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇත.

## 3.3 මුදල් අංශය

### 3.3.1 වාර්ෂික මුළු ප්‍රතිපාදන වියදම

2013 වර්ෂය වෙනුවෙන් ජාතික පොලිස් කොමිෂන් සභාවට වාර්ෂික අයවැය ලේඛනය මගින් පුනරාවර්තන වියදම් සඳහා රු. මිලියන 38.748 ක් සහ ප්‍රාග්ධන වියදම් සඳහා රු. මිලියන 0.210 ක් වශයෙන් රු. මිලයන 38.958 ක මුළු ප්‍රතිපාදනයක් අනුමත කර තිබුණි.

මෙයට අමතරව 2013 වසරේ අයවැය යෝජනා මගින් සිදුකරන ලද වැටුප් වැඩිවීම් ගෙවීම සඳහා අවශ්‍ය හිඟ ප්‍රතිපාදන ලෙස රු. මිලියන 1.275 ක මුදලක් පුනරාවර්තන වියදම් යටතේද 2012 වසරේ ආනයනය කරන ලද සභාපතිතුමාගේ නිල රථය සඳහා ගෙවීම් කිරීමට රු. මිලයන 5.150 ක මුදලක් ප්‍රාග්ධන වියදම් යටතේද වන පරිදි රු. මිලියන 6.425 ක අතිරේක ප්‍රතිපාදනයක් 2013 වසර තුළ මහා භාණ්ඩාගාරය විසින් ලබාදෙන ලදී.

ඒ අනුව 2013 වසරට පුනරාවර්තන වියදම් වශයෙන් රු. මිලියන 40.023 ක් සහ ප්‍රාග්ධන වියදම් වශයෙන් රු. මිලියන 5.360 ක් වශයෙන් රු. මිලියන 45.383 ක මුළු ප්‍රතිපදනයක් අනුමත කර තිබුණි.

ඉහත ප්‍රතිපාදන වලින් 2013 වසරේ පුනරාවර්තන වියදම් ලෙස රු. මිලියන 39.674 ක මුදලක් සහ ප්‍රාග්ධන වියදම් ලෙස රු. මිලියන 5.219 ක මුදලක් වශයෙන් රු. මිලියන 44.893 ක මුදලක් වැයකර ඇත. ඒ අනුව පුනරාවර්තන ප්‍රතිපාදන වලින් 99.13% ක ප්‍රමාණයක් සහ ප්‍රාග්ධන ප්‍රතිපාදන වලින් 97.37% ක ප්‍රමාණයක් වන සේ 2013 වර්ෂයේ මුළු ප්‍රතිපාදනයෙන් 98.92% ප්‍රතිශතයක් උපයෝජනය කර ඇත. මුළු ප්‍රතිපාදන සහ වියදම් දැක්වෙන වාර්තාවක් මේ සමඟ අමුණා ඇත. (ඇමුණුම II)

### 3.4 මාධ්‍ය ඒකකය

පොලිස් කොමිෂන් සභාවේ යහපත් ප්‍රතිරූපය ගොඩනැංවීමත්, කොමිෂන් සභාව විසින් සිදුකරනු ලබන කාර්යයන් පිළිබඳ මහජනතාවත්, ජනමාධ්‍යත් දැනුවත් කිරීමත් මාධ්‍ය ඒකකයේ ප්‍රමුඛතම කාර්ය භාරය වේ.

මාධ්‍ය ඒකකය මගින් 2013 වසරේ සිදුකර ඇති කාර්යයන් පහතින් සංක්ෂිප්ත වශයෙන් දක්වා ඇත.

- 2013 ජුනි මාසයේ ජාතික පොලිස් කොමිෂන් සභාව නව පරිශ්‍රයට පිවිසීම සනිටුහන් කළ උත්සවය සඳහා පුළුල් මාධ්‍ය ආවරණයක් ලබා දීමට කටයුතු කිරීම.
- 2013 වර්ෂයේ කොමිෂන් සභාව විසින් ඉටුකරනු ලැබූ කාර්යන් සහ කටයුතු ඇතුලත් වන පරිදි නිර්මාණය කළ ජාතික පොලිස් කොමිසම පුවත් වෙළුම භාෂා තුනෙන් නිර්මාණය කර මුද්‍රණය කර ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම සේවා කාර්යාල ඇතුළු ග්‍රාමීය මට්ටමේ මහජන ආයතන වෙතත්, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඇතුළු වෙනත් රාජ්‍ය ආයතන වෙතත් යැවීමට කටයුතු කිරීම. ඊට අමතරව ජාතික පොලිස් කොමිෂන් සභා වෙබ් අඩවිය ඔස්සේද ප්‍රසිද්ධ කිරීම.
- මුද්‍රිත මාධ්‍ය වල පල වූ පොලීසිය සහ කොමිෂන් සභාවට අදාල වාර්තා සහ ලිපි කොමිෂන් සභාවේ අවධානය සඳහා සතිපතා ඉදිරිපත් කිරීම.

- 2013 වසරේ දෙසැම්බර් මාසයේ හඳුන්වා දුන් 0710 – 361010 දරණ දුරකතන අංකය පිළිබඳ පුළුල් මාධ්‍ය ප්‍රචාරයක් විද්‍යුත් හා මුද්‍රණ මාධ්‍ය හරහා ලබා දීමට කටයුතු කිරීම.
- මානව හිමිකම් පිළිබඳ අමාත්‍යාංශය විසින් මෙහෙය වූ ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම සහ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයේ විශ්ව කාලීන සමාලෝචන රැස්වීමට ජාතික පොලිස් කොමිෂන් සභාව නියෝජනය කරමින් මාධ්‍ය නිලධාරී අඛන්ඩව සහභාගී වීම.

**3.5 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය**

- ත්‍රෛභාෂික වෙබ් අඩවිය ක්‍රියාත්මක කර පවත්වාගෙන යාම.
- 2013 වසරේ නිකුත් කළ පුවත් වෙළුම වෙබ් අඩවියේ එල කිරීම.
- නව පරිශ්‍රයේ දුරකතන පද්ධතිය හා පරිඝනක ජාලය ස්ථාපනය කිරීම සහ BMICH පරිශ්‍රය තුළ ස්ථාපනය කරන ලද ජාතික පොලිස් කොමිෂන් සභා කාර්යාලය ඇතුලත සැලැස්ම සකස් කිරීම.

**නිගමනය**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් කොමිෂන් සභාව වෙත වරම් ලබා දී ඇති රාජකාරි සහ වගකීම් සාර්ථක ලෙස ඉටුකර ඇති බව ජාතික පොලිස් කොමිෂන් සභාව සතුටින් වාර්තා කර සිටී.

## සේවක සංඛ්‍යා තොරතුරු - 2013

**අමාත්‍යාංශය : ජාතික පොලිස් කොමිෂන් සභාව**

**ලිපිනය : නො. 09 ගොඩනැගිල්ල, BMICH පරිශ්‍රය, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.**

| තනතුර | සේවය | ශ්‍රේණිය / පන්තිය | වැටුප් කේතය | සේවා මට්ටම | අනුමත සේවක සංඛ්‍යාව | | | පවත්නා සේවක සංඛ්‍යාව | | | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ස්ථිර | අනියම් | කොන්ත්‍රාත් | ස්ථිර | අනියම් | කොන්ත්‍රාත් | |
| ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. | විශේෂ | SL 3 | I | 1 | - | - | 1 | - | - | - |
| අධ්‍යක්ෂ (ම.පැ.) | ශ්‍රී.ලං.ප.සේ. | I | SL 1 | I | 1 | - | - | - | - | 1 | - |
| අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ. | I | SL 1 | I | 2 | - | - | - | - | 2 | - |
| සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. | III | SL 1 | I | 1 | - | - | 1 | - | - | - |
| ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ. | II/III | SL 1 | I | 1 | - | - | - | - | 1 | - |
| පළාත් අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ. | I | SL 1 | I | 9 | - | - | - | - | 9 | - |
| පරිපාලන නිලධාරී | රා.ක.ස.සේ | අධි | MN 7 | 2 | 1 | - | - | - | - | - | - |
| භාෂා පරිවර්තක | භා.සේ. | TS | MN 6 | 2 | 1 | - | - | - | - | - | - |
| තොරතුරු හා තාක්ෂණ නිලධාරී | ශ්‍රී.ලං.තො.තා.සේ. | SLICT | MT 1 | 2 | 1 | - | - | - | - | - | - |
| මාධ්‍ය නිලධාරී | දෙපා. | - | MN 4 | 3 | 1 | - | - | 1 | - | - | - |
| වැඩ සටහන් සහකාර | දෙපා. | - | MN 4 | 3 | 12 | - | - | 11 | - | - | - |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.ක.ස.සේ | - | MN 2 | 3 | 16 | - | - | 9 | - | 2 | - |
| දත්ත සටහන් ක්‍රියාකරු | දෙපා. | - | MN 1 | 3 | 4 | - | - | 4 | - | - | - |
| රියදුරු | රි.සේ. | - | PL 3 | 4 | 4 | - | - | 3 | - | - | - |
| ත්‍රී රෝද රථ රියදුරු | දෙපා | - | PL 2 | 4 | 1 | - | - | 1 | - | - | - |
| කාර්යාල කාර්ය සහායක | කා.කා.සේ. | - | PL 1 | 4 | 8 | - | - | 8 | - | - | - |

## ජාතික පොලිස් කොමිෂන් සභාව
## මුළු ප්‍රතිපාදන සහ වියදම් - 2013 වර්ෂය

| වැය විෂය | විස්තරය | 2013 වාර්ෂික අයවැය ප්‍රතිපාදන රු. | 2013 අතිරේක ප්‍රතිපාදන රු. | මු.රෙ. 66 මාරු කිරීම් රු. | 2013 වර්ෂයට අනුමත ශුද්ධ ප්‍රතිපාදන රු. | 2013 වර්ෂයේ මුළු වියදම රු. |
|---|---|---|---|---|---|---|
| | **පුනරාවර්තන වියදම්** | **38,748,000** | **1,275,000** | **-** | **40,023,000** | **39,673,515** |
| | **පුද්ගල පඩිනඩි** | | | | | |
| 1001 | වැටුප් හා වේතන | 9,000,000 | | (600,000) | 8,400,000 | 8,208,192 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 100,000 | | | 100,000 | 94,673 |
| 1003 (11) | වෙනත් දීමනා | 7,500,000 | 1,275,000 | 900,000 | 9,675,000 | 9,658,348 |
| 1003 (21) | වෙනත් දීමනා | 3,113,000 | | | 3,113,000 | 3,112,800 |
| | **ගමන් වියදම්** | | | | | |
| 1101 | දේශීය | 30,000 | | 20,000 | 50,000 | 45,119 |
| 1102 | විදේශීය | 30,000 | | (28,000) | 2000 | - |
| | **සැපයීම්** | | | | | |
| 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 200,000 | | 100,000 | 300,000 | 298,603 |
| 1202 | ඉන්ධන | 400,000 | | 450,000 | 850,000 | 823,269 |
| 1203 | ආහාර පාන හා නිල ඇඳුම් | 25,000 | | | 25,000 | 23,853 |
| | **නඩත්තු වියදම්** | | | | | |
| 1301 | වාහන | 200,000 | | 43,000 | 243,000 | 242,395 |
| 1302 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 100,000 | | 28,000 | 128,000 | 117,865 |
| 1303 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 50,000 | | | 50,000 | 38,568 |
| | **සේවා** | | | | | |
| 1401 | ප්‍රවාහන | 400,000 | | 385,000 | 785,000 | 754,729 |
| 1402 | තැපැල් සහ සංනිවේදන | 500,000 | | 300,000 | 800,000 | 797,095 |
| 1403 | විදුලිය හා ජලය | 2,500,000 | | 100,000 | 2,600,000 | 2,581,288 |
| 1404 | බදුකුලී සහ පළාත් පාලන ආයතන බදු | 10,450,000 | | (879,000) | 9,571,000 | 9,548,582 |
| 1405 | වෙනත් | 4,000,000 | | (835,000) | 3,165,000 | 3,162,695 |
| | **මාරු කිරීම්** | | | | | |
| 1506 | රජයේ සේවකයින් සඳහා දේපළ ණය පොලී | 150,000 | | 16,000 | 166,000 | 165,441 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | **මූලධන වියදම්** | **210,000** | **5,150,000** | **-** | **5,360,000** | **5,219,339** |
| | **මූලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්** | | | | | |
| 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 30,000 | | | 30,000 | 29,389 |
| 2003 | වාහන | 50,000 | | | 50,000 | 32,000 |
| | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | | | | | |
| 2101 | වාහන | | 5,150,000 | | 5,150,000 | 5,077,757 |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 30,000 | | | 30,000 | 26,472 |
| 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 50,000 | | | 50,000 | 23,471 |
| | **මානව සම්පත් සංවර්ධනය** | | | | | |
| 2401 | කාර්ය මණ්ඩල පුහුණු කිරීම් | 50,000 | | | 50,000 | 30,250 |
| | **එකතුව** | **38,958,000** | **6,425,000** | **-** | **45,383,000** | **44,892,854** |